25 වන පිටෙන්

කාලයේ මා ලියූ ලිපියක් ටයිප්සෙටින් කිරීමේ අංශයට යොමුවන විට මා ලියූ අකුරු ප්‍රමාණයට වැඩියෙන් රතු අකුරින් බණ්ඩාර අයියා ලියන ලද අකුරු බොහෝය. එවන් අවස්ථාවක හිත් නොහොඳකම් හඳුනා ගන්නට සුනිල් අයියාට හැකිය. එවන් එක් දිනෙක ඔහු මුල් ලිපියේ කොපිය ගෙන්වා ගත්තේය. එය හොඳින් මුල සිට අගට කියවූ ඔහු මගේ අතින් ඇද ගෙන බණ්ඩාර අයියා සිටි තැනට ගියේය.

"මචං වැවේ, අපි ලියන ශෛලියටම මුන්ගෙ ඒවත් තියෙන්න ඕන නෑ. උන්ට උන්ගෙම කියලා ශෛලියක් තිබුණාවේ. අකුරු වැරදි නම් හදපන්. අවුල් තැනක් තියේ නම් කපන්නෙ කොටන්නෙ නැතිව කියල දීපන්. එතකොට මූ ඒක හදාගනියි." සුනිල් අයියා කීවේය. එතැන් සිට මගේ ලියවිලි ද, බණ්ඩාර අයියාගේ රතු පෑන් අකුරු ද වෙනස් විය. එහෙත් වැඩි කාලයක් නොගියේය. ජවිපෙ, චන්ද්‍රිකා රජය සමග සහයෝගිතා ගිවිසුමකට එළඹෙමින් සිටියේය. පුවත්පත නොපවත්වාගෙන යන තැනට කළමනාකාරිත්වය කල් තියා අනතුරු ඇඟවීම් කරමින් තිබිණි. තෙමසක පමණ කාලයක් කිහිපදෙනෙකුට මිසක මුළු කාර්ය මණ්ඩලයට වැටුප් පවා ගෙවා තිබුණේ නැත. එහෙව් තත්ත්වයක් තුළ එළියට බසින්නට සිදුවන බැව් දැන දැනම අවස්ථාව එළඹෙනතුරු බලා සිටින්නට අපට සිදුවිය. හදිසියේම අප කැටුව හිමිකරුගේ කාමරයට ගිය සුනිල් අයියා සිය දබරැගිල්ල දිගු කළේය.

"මිස්ටර් කළුආරච්චි, අපි තුට්ටු දෙකට පත්තර කරපු උන් නෙවෙයි. මට නැතත් කමක් නෑ මේ පොඩි උන්ගෙ පඩි දෙන්න ඕන. උන් තාම ඉගෙන ගන්න එවුන්" සුනිල් අයියා කේන්තියෙන් පුපුරු ගසමින් සිටියේය. විසඳුමක් ලෙස එදින දෙදෙනෙකුගේ වැටුප් පමණක් ගෙවිය හැකි බව කළමනාකාරිත්වය දන්වා සිටියේය.

ඒ වන විටත් මා හට බැංකු ගිණුම් අංකයක් හෝ නොතිබුණු නිසා මාගේ තෙමසක වැටුප ද බණ්ඩාර අයියාගේ ගිණුමට බැරකරන බව දැන්වූයෙන් අප දෙදෙනාම අනතුරුව රත්මලාන හංදියට පයින්ම ඇවිද ආවෙමු. බැංකු ගිණුමෙන් ගත හැකි අවසන් රුපියල ද ගත් දෙදෙනාගේ හිඟ වැටුප් වලට එහි ශේෂය සමාන නොවිණි.

"කමක් නෑ. උඹ ගනින්. මට ගෙදර යන්න රුපියල් සීයක් ඇති." මට හිමිවිය යුතුව තිබුණු මුදල් සියල්ල මගේ සාක්කුවට ඔබා බස් ගාස්තුව විතරක් අතට ගත්තු බණ්ඩාර අයියා කුලියාපිටියට යනු පිණිස බස් එකට නැංගේය. ඒ අප ලක්නද කාර්යාලයේ හමු වූ අවසන් දිනයයි.

කාලය ගෙවී ගියේය. විමල් වීරවංශ, රාජපක්ෂ රෙජිමයට හේත්තු වී 2010 මහමැතිවරණයට සන්ධානයෙන් තරග කොට ඇමති පදවියක් දිනා ගත්තේය. මැතිවරණ මෙහෙයුම් කාර්යාලය විවෘත කිරීමේ අවස්ථාවට සුනිල් අයියා ද එක්ව පොල් තෙල් පහන් සිළ දැල්වීය. විභූති මල්ලිට දෝතම අල්ලා ආශිර්වාද කළේය.

ලක්මිණ පුවත්පතේ කවි පිටුවට චිත්‍ර අඳින්නට ඩලස් අලහප්පෙරුම විසින් කැටුව ආ කැහැටු කොල්ලා මේසා දුර ගමනක් පැමි□ම ගැන සුනිල් අයියා හදවතින්ම සතුටු වන්නට ඇත. එසේම භීෂණයේ දෝංකාරය මැදින් බොරලැස්ගමුව කාර්යාල කාමරයේ සඟවා රැකබලා ගැනීමට හැකිවීම ගැන ආඩම්බර වන්නට ද ඇත. දැන් සුනිල් අයියාට වසර 70 කි. එදා කවි පිටුවට කවි රැගෙන පැමිණි මනෝරා අක්කා අද සුනිල් අයියාගේ ආදර□ය බිරිඳ ය. රැකබලා ගත් කොලුවා මෙන්ම, කොලුවා කැටුව ආ ඩලස් ද වත්මන් රජයේ ප්‍රබල ඇමතිවරුන්ය. එහෙත් කවි පිටුවේ සංස්කාරකවරයා වන රෝහිත භාෂණ තමන්ගේ මිතුරන් පාලකයන් වී ඇති රටක ජීවිත ආරක්ෂාව පතා ජර්මනියේය. 2003 වසරේ දෙසැම්බර් මස 10 වන දින (ජගත් මානව හිමිකම් දින) සුනිල් අයියා ලක්නද පුවත්පතේ සත්‍යවාදියෙකුගේ දිනපොතට සටහනක් තබමින් මෙසේ ලිවීය.

පාර්ලිමේන්තු මංසන්ධියේ පිහිටි ඞඅහිංසකයින්ගේ ආරාමයඬ කියන ස්ථානයේ ප්‍රධාන උත්සවයක් පවත්වන බව දැනගත් විට මගේ හිතට පුංචි දුකක් ඇතිවුණා. මට මතක් වෙන්නේ ඇඹිලිපිටියෙ අතුරුදහන් වුණු ශිෂ්‍යයන් හා ඔවුන්ගේ මව්පියන්. සමහර ශිෂ්‍යයින්ගෙ මුහුණු මගේ සිතේ තැන්පත් වෙලා තියෙනවා. මේ දරුවන්ගෙ අම්මලා තාත්තලා හමුවෙන්න තිස් හතළිස් වතාවක් ඇඹිලිපිටියෙ ගිහින් තියෙනවා. ඔවුන්ගේ කඳුළු මොන තරමක් මගේ මුහුණේත් පපුවේත් තැවරෙන්න ඇත්ද?

එදා එසේ ලියූව ද අද 70 වෙනි වියට පා තබන මොහොත වන විට අද අහිංසකයින්ගේ ආරාමය තිබූ තැනක සලකුණක් හෝ සොයා ගැනීමට නොහැකි තරමට සුන්දර මල් වෙළඳ සංකීර්ණයකි. ලස්සන පිඟන් ගඩොල් අතුරා පිළියෙළ කර ඇති ඇවිදින මං තීරුවල සුන්දර ලලනාවෝ ආහාර දිරවනු පිණිස දුවමින් සිටිති. පාරෙන් මෙහා පස පැවති නාලන්ද එල්ලාවල පිළිරුව ද නැත. අහිංසකයින්ගේ මළ මිනී වෙන්දේසි කරමින්, පීඩිත මව්වරුන්* පියවරුන්ගේ ලේ ඩහදිය කඳුළු මතින් ඉහළ නඟින උන් ජීවත් වන්නවුන්ටත් වැඩියෙන් මිය ගියවුන්ට බියය. ස්මාරක මිහිදන් වන්නේ ඒ නිසාය. තම මිත්‍රයාගේ ඝාතකයින්ට දඬුවම් දෙන්නට මිනියේ අත තබා දිවුරූ ඩිලාන් පෙරේරලා ඝාතකයින් සමඟ එකම කැබිනෙට්ටුවේය. එදා සුනිල් අයියා අප සමඟ මත්පැන් වඩියක් තොල ගා පුෂ්කින්ලා, ගෝර්කිලා, ඩොස්ටවුස්කිලා ගැන කතා කළ ප්‍රෙස් ක්ලබ් නම් සොඳුරු නවාතැන්පොළ අද බිමට සමතලා වී තිබේ. බහුජාතික සමාගමක මහාපරිමාණ හෝටල් ව්‍යාපෘතියක් ඒ බිම ගිලගෙන තිබේ. පත්‍රකලාවේදීන් වෙනුවෙන් හිමි වූ මත්පැන් බලපත්‍රය මැක්රීන් මුදලාලිගේ ලාච්චුවට වැටී ඇත. සත්‍යවාදියෙකුගේ දිනපොතට නිමිති වුණු ආමර් වීදියේ බාර් එක අසළදී හමුවුණු සිඟන්නන්, ගණිකාවන්, ගැටකපන්නන්, නාට්ටාමිවරුන් වැනි සමාජයේ පරිධියට තල්ලු වී සිටි මිනිසුන් වෙනුවෙන් සුනිල් අයියා එදා හදවතින්ම සුසුම් හෙළුවේය. අද එකී මිනිසුන් මතු නොව කොළඹ පැල්පත් වාසීන්, පදික වෙළෙඳුන් ලස්සන නගරයකට් අවලස්සන බැවින් පලවා හැර තිබේ. දිනෙන් දිනම පලවා හරිමින් තිබේ.

දයාබර සුනිල් අයියේ, මිනිසුන්ට සිනාසෙන්නට නොව මිනිසුන් සමඟ සිනාසෙන්නට නුඹ ඉගැන්වූ නිසාම පීඩිතයින් එළවා දමන නගරයකට නොව පීඩිතයින්ගේ ජීවිත ද ලස්සන වී පීඩිතයින් සමඟ ලස්සන වන නගරයකට අප වඩාත් කැමතිය. ඔබ පසු කලෙක පාලකයින්ට දරදිය ඇද්දේය. දේශප්‍රේමීත්වයේසළු පොරවා ගත් වෘකයින්ට ද අත දුන්නේය. අප සිත් බොහෝ රිදුණේය. ඔබ නිතර මිමිනූ වදනක් තිබුණේය. ඒ " මට හොඳ අතීතයක් තිබුණා" යන්නය. වසර 70 ක් යනු බොහෝ කාලයකි. ඔබ තවත් බොහෝ කාලයක් අප අතර සිටිය යුතුය. මේ ලියැවිල්ල ද, ගෞරවාදරය ද ගෙවුණු කාලයේ ඔබ ඉතිරි කළ හොඳ අතීතය වෙනුවෙනි.



## නිදොස්කෙට නිදහස්




''එම්බල ඉන්ද්‍රතිස්ස. කෙසේද නඩු කටයුත්ත. මගේ කොලු පැටව් ටික නිදොස් කර නිදහස් කරගන්න තට පුළුවන් වෙයිද?''

''එසේය මහරජතුමනි. මම ඊට අවශ්‍ය කෙස් පලන තර්ක ගොඩනගා ඉදිරිපත් කර අවසන්. දැනටමත් ඔබවහන්සේගේ ගෝලයෝ නිදහස්. තීන්දුව විතරයි අඩු''

''අහා, ප්‍රීතියි. ප්‍රීතියි. කිමෙක්ද තා ඉදිරිපත් කළ තර්ක''

''ඔබවහන්සේගේ කොල්ලො ටික එකතුවෙලා සුද්දිව කෙලෙසුවා කියලා ඔප්පු කරන්න තිබුණ එකම සාක්ෂිය වෙද අම්මණ්ඩිගේ රිපෝට් එකනේ. වෙද අම්මණ්ඩි කියලා තිබුණානේ කෙලෙසුවා කියලා කියන්න පුළුවන් තුවාල පහක්ම සුද්දිගෙ රහස් ප්‍රදේශවල තිබුණා කියලා ''

''අම්මපා?''

''මම වෙද අම්මණ්ඩිගෙන් ඇහුවා දරුණු ලිංගික චර්යා තියන පුද්ගලයෙක් තමන්ගේ බිරිය සමඟ එකතුවෙන අවස්ථාවක වුණත් ඒ තුවාල ඇතිවිය හැකියි නේද කියලා. අම්මණ්ඩි ඔව් කිව්වා.''

"ඉතිං"

''ඇතැම් ජන වර්ගවල පිරිමින් එලෙස දරුණු ලිංගික චර්යා දකවන බව ඔබ දන්නවාද කියලා ඇහුවා. අම්මණ්ඩි ඔව් කිව්වා.''

"ඉතිං"

''මේ සුද්දිගෙ පෙම්වතා කාපිරියෙක්. එම ජනවර්ගයේ ලිංගික හැසිරීම් දරුණුයි. ඔහු සමඟ එක්වීමේදී වුවත් සුද්දිට මේ තුවාල සිදුවිය හැකියි නේද කියලා මම ඇහුවා. අම්මණ්ඩි ඔව් කිව්වා.?''

''හ්ම්''

''ඔන්න මගේ වෙලාව. දැම්ම උඩුකුරුංඣද්ඣදං වෙලා යන්න ලෝ පොයින්ට් ටිකක්. 'ස්වමීනි, මෙ සුද්දි කිසිම තැනක කියලා නෑ පිරිසක් ඈ කෙලෙසුවා කියලා. මේ තුවාල කොහොම වුණාද කියලා කියන්නත් ඇය දන්නේ නෑ. වෙද හාමිනේ පිළිගන්නවා මේ තුවාල දරුණු ලිංගික හැසිරීම් තියන ස්-වාමියෙකුගෙන් බිරියකටත්, පෙම්වතෙකුගෙන් පෙම්වතියකටත් විය හැකියි කියලා. එදින මේ දෙ-දෙනාම අධික ලෙස බීමත්ව සිටි බව සෙසු සාක්ෂිවලින් තහවුරු වෙනවා. ඒ අනුව මේ තුවාල බීමත් කාපිරියාගේ වැඩ නිසා සුද්දිට වෙච්ච තුවාල මිස මහ රාජාණන්ගේ ගෝලයෝ කෙළෙසීමෙන් සිදුවූ තුවාල නෙවෙයි කියලා මම යෝජනා කරනවා.' කියලා කිව්වා."

''හප්පොච්චියේ බොල ගල් පැලෙන තර්කයක් නේ''

''ගල් පැලුනද කියන්න නම් දන්නේ නෑ මහරජාණෙනි, ඒ වෙලාවෙ විදුලිය නම් විසන්ධි වුණා.''

''එතකොට මිනී මැරුම් චෝදනාව''

''ඒකත් පුස් කළා. කාපිරියාගේ දරුණු ලිංගික හැසිරීම් ඉවසාගත නොහැකිව සුද්දි උෟට කැඩුණු බෝතලකින් පහරදීමෙන් සිදුවූ කැපුම් තුවාලවලින් සිදුවූ මරණයක් මිස මහරජාණන්ගේ ගෝලයන්ගෙන් එල්ල වුණ ප්‍රහාරයකින් සිදුවූ එකක් නොවෙයි කියලා මම කිව්වා."

''එතකොට මගේ කොලු පැටව් ටික උන් දෙන්නත් එක්ක අල්ලපු ජල්ලිය මොකක්ද කියලා බැන්චි ඇහුවෙ නැතෙයි''

''අහුවා. ඇහුවා. මම කිව්වා මේ සුද්දියි කාපිරියයි දෙන්නා අපේ රටේ සංස්කෘතිය, සභ්‍යත්වය, ශිෂ්ඨාචාරය වනසමින්, මාතෘ භූමියේ අභිමානය කෙළෙසමින්, ප්‍රසිද්ධියේ දරුණු ලිංගික ක්‍රියාකාර-කම්වල යෙදෙනවා දැකලා ඒක වළක්වන්න සභාපතිතුමයි ගෝලයොයි උත්සාහ කළා මිසක් කිසිම නරක දෙයක් කළේ නෑ කියලා.''

''ප්‍රීතියි තිස්ස ප්‍රීතියි. තා වැනි වුන් සිටීම මගේ රාජ්‍යයට මහත් ආඩම්බරයක්. කිමෙක්ද තට අවශ්‍ය නොවළහා කියව.''

''හික් හික් නීතිපතිකම වගේ දෙන්න පුළුවන් නම් ලොකු දෙයක් මහරජාණෙනි''

''නීතිපති කමෙන් තට කවර එලයක්ද තිස්ස. මම තට මගේ රාජ්‍යයේ අගවිනිසුරුකම පවරන්නෙමි. හොං හොං හොං''

ම.රා. සාද්.

**LEARN JAPANESE**

By a Qualified Experienced Teacher (Northern Suburbs).

PREP to VCE
Help in essay writing, exam tips,
conduct mock tests
and preparation for VCE oral exam.
Individual classes for reasonable rates.

**Contact: 0425396975**

**ජ්‍යොතිෂය /ASTROLOGY**

භාව කේන්ද්‍රය අනුව පලාපල කථනය,
කේන්ද්‍ර සෑදීම, නැකැත් සෑදීම,
පොරොන්දම් බැලීම හා විවාහ දෝෂ පරීක්ෂා කිරීම
සියළුම ජ්‍යොතිෂ කටයුතු සඳහා විමසන්න.

ජ්‍යොතිර්වේදී
**දේවසිරි විද්‍යාරත්න (M.A)**
90777523 - 0406 864 793